# නූතන කෞතුකාගාර සංකල්පය යටතේ ශ්‍රී ලංකාවේ කෞතුකාගාර ප්‍රවර්ධනය තුළින් සංචාරක ආකර්ශනය ළගා කර ගැනීම

**මැණිකේ ඩී.ඒ.එස්.එම්,[1] හර්ෂණී එම්.එම්.එම්.[2]**

ශිෂ්ටාචාරයන්හි මෙන්ම ජීවයේ ඉතිහාසය ඇරඹුනු දා පටන්ම යුගයන් අතික්‍රමණය කරමින් වර්තමානය දක්වාම මිනිසා පසුකළ අවධීන් හා මානවයා මෙන්ම මානවයාගේ පරිණාමය හා සම්බන්ධ ද්‍රව්‍යාත්මක ඉතිහාසය පිළිඹිබු කරන්නා වූද ක්‍රමානුකූලව ගබඩාකොට ප්‍රදර්ශනය කරන ස්ථානයක් ලෙස කෞතුකාගාරය පෙන්වාදිය හැකිය. නූතන කෞතුකාගාර සංකල්පය යටතේ ලෝකයේ කෞතුකාගාර තාක්ෂණික අතින් දියුණුවක් ලැබුවද ලංකාව තුළ බොහොමයක් කෞතුකාගාර තවමත් පවතින්නේ පැරණි සංකල්පයටම රාමු වී තාක්ෂණික වශයෙන් දියුනුවක් නොලද මට්ටමේය. මේ නිසාම ශ්‍රී ලංකාවේ කෞතුකාගාර රැසක් පැවතුන ද ඒ පිළිබදව දෙස් විදෙස් සංචාරකයින් ඉතා සුළු ප්‍රමාණයක් පමණක් දැනුවත් වී ඇත. මෙම අධ්‍යනයේදී අවධානය යොමු කරන්නේ ශ්‍රී ලංකාවේ පවතින කෞතුකාගාර නූතන තාත්ෂණික සංකල්පය යටතේ ප්‍රවර්ධනය කර ඒ තුළින් සංචාරක ආකර්ශනය ලගා කර ගැනීමයි. මේ සදහා ගතහැකි ක්‍රියා මාර්ග බොහෝය. කෞතුකාගාර මගින් ප්‍රවර්ධන වැඩසටහන් දියත් කිරීම, අධනපනික වැඩමුළු සංවිධානය කිරීම, විනෝදාස්වාදය අරමුණු කරගත් ක්‍රියාකාරකම් පැවැත්වීම, තාවකාලික හා ජංගම ප්‍රදර්ශන පැවැත්වීම, කෞතුකාගාර තුළ නූතන තාක්ෂණික උපකරණ භාවිතා කිරීම, කෞතුකාගාර ප්‍රවේශපත් අන්තර්ජාලය හරහා ලබා ගැනීමට සැලසීම, කෞතුකාගාර පිළිබද තොරතුරු සංචාරකයන්ට දැන ගැනීම උදෙසා වෙබ් අඩවියක් හා අන්තර්ජාල පිටුවක් නිර්මාණය කිර්ම, ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍ය භාවිතා කිරීම ආදිය පෙන්වා දිය හැකිය. මේ අන්දමට වර්තමාන නව ප්‍රවර්ධන ක්‍රමයක් ලෙස අන්තර්ජාලය හා සමාජ වෙබ්අඩවි මගින් සංචාරකයන්ට කෞතුකාගාරයක ඇති වැදගත්කම හා වටිනාකම් පිළිබද ශ්‍රව්‍ය හා දාශ්‍ය මාධ්‍යයෙන් අවබෝධයක් ලබා දීම තුළින් සංචාරකයන් කෞතුකාගාර කෙරෙහි ගෙන්වා ගැනිමට හැකියාවක් තිබේ. ශ්‍රී ලංකාව තුළ විහිදී පවතින බොහෝ කෞතුකාගාර පැරණි සංකල්පය යටතේම පැවතීම හා තාක්ෂණික වශයෙන් දියුණුවක් නොලැබීමත් ඒ සමග ශ්‍රී ලංකාව කෙරෙහි සංචාරක ආකර්ශනය අඩුවීමත් දක්නට ලැබේ.. මේ ආකාරයට කෞතුකාගාර ප්‍රවර්ධනය තුළින් ශ්‍රී ලංකාව් කෞතුකාගාර පිළිබද සංචාරකයා තුල පවතින ප්‍රතිරූපය වෙනස් කර නව ප්‍රතිරූපයක් නිර්මාණය කිරීමට හැකි වේ. සංචාරක අවශ්‍යතා සපුරා ගැනිමට හැකිවන පරිදි නව තාක්ෂණික ශිල්පීය ක්‍රම මගින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්යේ දියුණුව හා සංචාරක ආකර්ශනය ලගාකර ගත හැකිය.

**මුඛ්‍ය පද :** කෞතුකාගාර, සංචාරක, ප්‍රවර්ධනය, තාක්ෂණික

---

[1,2]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
sarojanimanel5@gmail.com